දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක.02/2004

මගේ අංකය:- සසෞ/4/1-2004,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.
2004.06. 18 දින.

පළාත් අධ්‍යක්ෂ(                    ),
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.

## පශු වෛද්‍ය කාර්යාල තුලින් එන්නත්සාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ආර්ථිකමය වශයෙන් වැදගත් රෝග වන කුර හා මුඛ, කාලගාත්‍රා සහ රක්තාශ්‍රව යන රෝග මර්ධනය සඳහා වාර්ෂිකව සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව එන්නත්සාර වැඩසටහන් සැලසුම් කර, ක්ෂේත්‍රයේ ක්‍රියාවට නංවන අතර, ඒ සඳහා අවශ්‍ය එන්නත්සාර සහ අනෙකුත් ද්‍රව්‍ය ලබාදීමට කටයුතු යොදා ඇත.

02. මෙසේ වාර්ෂිකව ඔබ පළාතේ පශු වෛද්‍ය කාර්යාලවලට සපයා එන්නත්සාර කල් ඉකුත්වීමට ඉඩ නොදී උපරිම ප්‍රයෝජන ලබාගැනීමට පහත සඳහන් උපදෙස් පිළිපදින මෙන් පශු වෛද්‍ය නිලධාරීන් දැනුවත් කරන ලෙස මෙයින් දන්වමි.

1. ඉහත සඳහන් රෝග සඳහා පශු වෛද්‍ය කොට්ඨාශය තුළ අවදානම් ප්‍රදේශ හඳුනාගෙන එම ස්ථානයන්හි රෝගයට පාත්‍ර විය හැකි සතුන් සංඛ්‍යාව ඉලක්ක කොට වසංගත රෝග මර්ධන සඳහා එන්නත් කිරීමට කටයුතු කළ යුතුය. විශේෂයෙන් ගවඝාතනාගාර හා සතුන් ගෙන යන මාර්ග අවට ප්‍රදේශ කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

2. පශු වෛද්‍ය කාර්යාලවල නියමිත උෂ්ණත්වය යටතේ එන්නත්සාර ගබඩාකර භාවිතා කළ යුතුය. එන්නත්සාර වැඩසටහන ආරම්භ කිරීමට සති දෙකකට කලින් අවශ්‍ය ප්‍රමාණය ලබා ගැනීමට කටයුතු කිරීමෙන් අනවශ්‍ය ලෙස එන්නත්සාර පශු වෛද්‍ය කාර්යාල තුළ ගබඩාකර තබා ගැනීම අවම කළ හැකි අතර, එන්නත්සාර නියමිත උෂ්ණත්වයක් තුළ තබාගත හැකිවේ.

3. එන්නත්සාර වැඩසටහන් ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන දිනය, ස්ථානය ආදී විස්තර ප්‍රධාන කාර්යාලයේ සත්ව සෞඛ්‍ය අංශය වෙත කල් ඇතිව දැන්විය යුතු අතර, අවශ්‍ය එන්නත් සහ වඩි ප්‍රමාණයන් දැක්විය යුතුය.

4. එන්නත්සාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ප්‍රථම ඔබ විසින් හඳුනාගත් අතියම් එන්නත්කරුවන්ගේ නාමලේඛනයක් මා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතුය. මෙම විශේෂ එන්නත්සාර වැඩසටහන සඳහා අතියම් එන්නත්කරුවන් යොදාගැනීම රජයේ නීතිරීති වලට අනුකූලව සිදුවිය යුතුය.

5. අවම වශයෙන් දිනකට එන්නත් 60ක් එක් පුද්ගලයෙකු විසින් කළ යුතුය. එලෙසම අතියම් එන්නත්කරුවන් සැමවිටම පළපුරුදු රජයේ නිලධාරියෙකු සමඟ ක්ෂේත්‍රයේ කටයුතු කළ යුතුය.

6. එන්නත්සාර වැඩසටහන ආරම්භ කිරීමට ප්‍රථම අදාල ප්‍රදේශයේ ගොවිමහතුන් දැනුවත් කර, ඔවුන්ගේ සහාය ලබාගෙන වැඩසටහන සාර්ථකව නිම කළ යුතුය.

7. එන්නත්සාර භාවිතයේදී එහි ආයුකාලය, පරිහරණය කරන විට පිළිපැදිය යුතු කරුණු සහ එන්නත්සාර තබාගත යුතු උෂ්ණත්වය ගැන සැලකිල්ලට ගනිමින් සෞඛ්‍යාරක්ෂිතව එන්නත් කටයුතු සිදුකළ යුතුය.

8. සියළුම පශු වෛද්‍ය කාර්යාලයන්හි නිසිපරිදි පවත්වාගෙන යනු ලබන එන්නත්සාර ලේඛනයක් තබන්නු කළ යුතු අතර, එමගින් එන්නත්සාර භාවිතය පිළිබඳව නිවැරදි දත්ත ලබාගැනීමට පහසුවනු ඇත.

(අත්සන)
එස්.කේ.ආර්.අමරසේකර,